# <u>බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව</u>

දිනය : 2017.07.31
වේලාව : ප.ව. 2.00
ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත.

**<u>සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය :</u>**

| | | | |
|---|---|---|---|
| **1)** | **එම්.ඒ.බී. දයා සෙනරත් මයා.** | **-** | **ප්‍රධාන ලේකම් (බ.ප)** |
| **2)** | **පී. සෝමසිරි මයා.** | **-** | **ආණ්ඩුකාර ලේකම්(බ.ප)** |
| **3)** | **එම්.ජී.ඒ.තිලකරත්න මයා.** | **-** | **ලේකම්,රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)** |
| **4)** | **හේමන්ත සමරකෝන් මයා.** | **-** | **සභා ලේකම් (බ.ප)** |
| **5)** | **එස්.ජී.විජයබන්ධු මයා.** | **-** | **ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප)** |
| **6)** | **එම්.කේ.කේ.ආර්.අබේදීර මිය.** | **-** | **ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය(බ.ප)** |
| **7)** | **එච්.ජී.ජී.ජේ.ධර්මසේන මයා.** | **-** | **ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප)** |
| **8)** | **ඩබ්ලිව්.එම්.දයාවතී මිය.** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)** |
| **9)** | **සිරිසෝම ලොකුවිතාන මයා.** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)** |
| **10)** | **ඩී.එම්.එන්.දිසානායක මිය.** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)** |
| **11)** | **ඩබ්.එම්.ඩී.එන්.රණසිංහ මයා.** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)** |
| **12)** | **ඔචිනි විජේවික්‍රම මිය.** | **-** | **ජ්‍යෙෂ්ඨ සහකාරලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප)** |
| **13)** | **එන්.ආර්. කැකුලන්දල මයා** | **-** | **සහකාර ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප.)** |
| **14)** | **කනිෂ්ක පී. ශ්‍රීලාල් මයා** | **-** | **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)** |
| **15)** | **කේ.එන්.සූරියආරච්චි මිය.** | **-** | **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)** |

**ලේකම්වරුන් විසින් පහත කරුණු පිළිබඳව සාකච්ඡා කළ අතර, පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | නිල නිවාස පිළිබඳ කාර්ය සාධන බලකාය සහ සංචාරක බංගලා ඉදි කිරීම | නුවරඑළිය සංචාරක බංගලාව ඉදිකිරීමට යෝජිත ඉඩමේ තක්සේරු කටයුතු සඳහා මධ්‍යම පළාත් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බැවින් එහි ප්‍රගතිය සම්බන්ධව විමසීමක් කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) වෙත උපදෙස් දෙන ලදී.<br><br>අනුරාධපුර ප්‍රදේශයේ සංචාරක බංගලා සඳහා පර්චස් 80 ක පමණ ඉඩමක් හෝ ඉදිකල නිවාසයක් ඉඩමක් සම්බන්ධව අනුරාධපුර ප්‍රාදේශීය ලේකම් වෙතින් විමසීමක් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන). |
| 02. | සංවර්ධන වැඩසටහන් සහ ප්‍රගති සමාලෝචනය. | එක් එක් අමාත්‍යාංශ මඟින් මේ වන විට ලබා ඇති ප්‍රගතිය නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් විස්තර කරන ලදී. මුළු ව්‍යාපෘති වලින් 100%ක් අවසන් කර ඇති ව්‍යාපෘති 12 ක් ද, ක්‍රියාත්මක අවධියේ පවතින ව්‍යාපෘති 64ක් සහ මූලික වැඩ කටයුතු අවසන් කළ ව්‍යාපෘති 23ක් ද, පවතින බව මෙහි දී වැඩිදුරටත් පෙන්වා දෙන ලදී.<br><br>2017 වර්ෂයේ සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය මේ වන විට අවම මට්ටමක පවතින බවත් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කල යුතු බවත් සාකච්ඡා විය.<br><br>එසේම 2018 වර්ෂයට අදාල වැඩසටහන් වලට අදාල යෝජනා 2017.08.31 දිනට පෙර එවන ලෙසත් මේ වසරේ අයවැය සකස් කිරීමේදී එම වැඩසටහන් වලට අදාලව ප්‍රතිපාදන ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදී.<br><br>එමෙන්ම සංවර්ධන වැඩසටහන් වලට අදාල ප්‍රසම්පාදන කටයුතු සඳහා ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරිවරයෙකු ලබාදෙන බවත් එම නිලධාරියා සමඟ සම්බන්ධීකරණය කර ගනිමින් වැඩසටහන්වල ප්‍රගතිය වැඩිකර ගැනීමට කටයුතු කරන ලෙසත් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| 03. | භාෂා ප්‍රතිපත්තිය, තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් නිල වෙබ් අඩවි යාවත්කාලීන කිරීම. | බස්නාහිර පළාතේ බොහෝ දෙපාර්තමේන්තු වල වෙබ් අඩවි නිසි පරිදි යාවත්කාලීන වී නොමැති බව නිරීක්ෂණය වී ඇති බවත් තිබෙන වෙබ් අඩවිවල ගුණාත්මක බව සකස් කර ගැනීමේ කටයුතු තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනයේ නියෝජිතයෙකු සම්බන්ධ කර ගෙන අවසන් කරන ලෙස ප්‍රධාන ලේකම් දැඩිව අවධාරණය කරන ලදී.<br><br>වෙබ් අඩවි යාවත්කාලීන කිරීමේ ප්‍රගතිය සම්බන්ධව නැවත සාකච්ඡා කිරීමට සති අන්තයක දිනයක් වෙන් කර ගන්නා ලෙස උපදෙස් දෙන ලදී.<br><br>සෑම ආයතනයකම වෙබ් අඩවිය භාෂා තුනෙන්ම යාවත්කාලීන විය යුතු බව සඳහන් කරන ලදී.<br><br>අදාල වෙබ් පිටු වල ධාරිතාව අඩු බැවින් ඉක්මනින් තොරතුරු මැකී යන බව සභා ලේකම් විසින් දන්වන ලදී. ඒ සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකසන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වෙත දන්වන ලදී. | අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 04. | තොරතුරු තාක්ෂණය මඟින් සේවා වැඩිදියුණු කිරීම. | තොරතුරු තාක්ෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය කඩිනමින් අනුමත කර එවන ලෙස පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ප්‍රධාන ලේකම් විසින් උපදෙස් දෙන ලදී.<br><br>එසේම මෙම වැඩසටහනට අදාල සෞඛ්‍ය අමාත්‍යාංශ හැර අනෙකුත් අමාත්‍යාංශ වලින් තොරතුරු ලබා දී ඇති බවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහකාර ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් තොරතුරු ගෙන්වා ගන්නා ලෙසත් මෙම සේවා වැඩිදියුණු කිරීම් සඳහා වන කමිටු වාර්තාව නොපමාව ලබා දෙන ලෙසත් ප්‍රධාන ලේකම් අවධාරණය කරන ලදී. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කමිටු සාමාජිකයින්. |
| 05. | පළාත් සභාව තුල විමර්ශන නිලධාරි සංචිතයක් ඇති කිරීම. | විමර්ශන කටයුතු සඳහා දීප ව්‍යාප්ත සේවාවන්හි III ශ්‍රේණියේ නිලධාරීන් පුහුණු කර සම්බන්ධ කර ගැනීම සුදුසු බව යෝජනා වූ අතර මේ සම්බන්ධව දින 3 ක ප්‍රායෝගික සැසි සහිත පුහුණු වැඩසටහනක් සංවිධානය කිරීමට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) වෙත දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 06. | මෙත් සෙවණ රජයේ නිවර්තන නිවාසය පිහිටි ඉඩම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට පැවරීම. | මෙත් සෙවණ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කිරීමට සඳහා රැස්වීමක් යොදා ගන්නා ලෙසත් ඒ සඳහා පළාත් පාලන ලේකම්තුමිය හා කොට්කාවත්ත ප්‍රාදේශීය සභාවේ ලේකම් කැඳවන ලෙසත් දැන්වීම.<br><br>2017.08.01 වන දින මෙත් සෙවණ පරිශ්‍රය පරීක්ෂා කිරීම ක්ෂේත්‍ර චාරිකාවක් යොදා ගන්නා ලෙසද ප්‍රධාන ලේකම් දන්වන ලදී. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 07. | දරුවන් සුරකිමු ජාතික වැඩසටහන 2017- 2019 | මෙම වැඩ සටහන සඳහා සඳහා සකස් කර ඇති සැලැස්ම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් ඉදිරිපත් කළ අතර දැනුවත් කිරිමේ වැඩසටහන් පමණක් ප්‍රමාණවත් නොවන බවත් පුළුල් ලෙස නිර්මාණාත්මක හා ඵලදායී වැඩසටහනක් සංවිධානය විය යුතු බවත් ප්‍රධාන ලේකම් විසින් දැන්විය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් මෙම වැඩසටහනේ වර්තමාන ප්‍රගතිය ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කළ බවත් ප්‍රකාශ කරන ලදී. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය.<br><br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 08. | වකුගඩු රෝග නිවාරණ ජාතික සැලැස්ම සහ මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන | මෙම වැඩසටහනට අදාලව පළාත් මට්ටමේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කිරිම සඳහා 2017.08.14 වන දින පෙරවරු 10.00 ට රැස්වීමක් කැඳවීමට ප්‍රධාන ලේකම් උපදෙස් දෙන ලදී. | ලේකම් , සෞඛ්‍ය අමාත්‍යාංශ<br><br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

## <u>ඉදිරිපත් කරන ලද නව යෝජනා</u>

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | බස්නාහිර පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ මාසික ගමන් වියදම් දීමනා සංශෝධනය කිරීම සම්බන්ධව අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වලින් ලැබෙන ඉල්ලීම් සඳහා නැවත සමාලෝචනායක් සිදු කිරීම | බස්නාහිර පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වෙතින් විස්තර ගෙන්වා ගෙන නැවත සමාලෝචනයක් පවත්වා පොදු තීරණයක් ගැනීම සුදුසු බව තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 02 | බස්නාහිර පළාත් ක්‍රීඩා නිලධාරීන්/ පුහුණුකරුවන් වෘත්තීය සංවර්ධන සඳහා විදේශ පුහුණු වැඩසටහන් වලට සහභාගී කරවීම සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළු සම්බන්ධව සාකච්ඡා කිරීම. | විදේශ පුහුණු හා සැසි සඳහා සහභාගී වීමට අදාල ජනාධිපති ලේකම් චක්‍රලේඛ සලකා බලා අමාත්‍යාංශ ලේකම් විසින් සෑහිමකට පත් වන්නේ නම් පවතින නීතිරීති වලට අනුකූලව නිර්දේශ කර එවන ලෙසත් ඉදිරිපත් වන ඉල්ලීම් සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් පාලනයක් සහිතව සුදුසුකම්ලාභින් සම්බන්ධ කරන ලෙසද ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දෙන ලදී.<br><br>එසේම වැඩසටහනේ අදාලත්වය පිළිබඳ පූර්ව හා පශ්චාත් වාර්තා ලබා ගැනිම ද කළ යුතු බව උපදෙස් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |

| | | | |
|---|---|---|---|
| 03 | බස්නාහිර පළාත් අභ්‍යන්තර විගණන අංශ සඳහා අනුයුක්ත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති ඉල්ලීම. | දැනට සිටින විගණන නිලධාරින්ගේ කාර්යය මණ්ඩලය වැඩි කර ගැනීම කළ යුතු බව ප්‍රධාන ලේකම් ප්‍රකාශ කරන ලදී. ඉදිරිපත් කර ඇති ඉල්ලීම පිළිබඳ සාකච්ඡා කරන ලද අතර උපාධියක් සහිත කළමනාකරණ සහකාර නිලධාරීන්ට විභාගයට පෙනී සිට විගණන නිලධාරී ලෙස පත් වීම ලබා ගත හැකි බවත්, කළමනාකරණ සහකාර සේවයේ I හා II පන්තියේ නිලධාරීන්ට විභාගයට ඉදිරිපත් වීමේ හැකියාව අනෙකුත් පළාත් සභා මෙම නිලධාරීන් බඳවා ගැනීමේ දී සලකා බලන්නේ ද යන්න සොයා බලන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) වෙත දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 04 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි සකස් කිරීම සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.) ලේකම් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය | බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථාවන් ගණනාවක් පිළිබඳ සාකච්ඡා වී ඇති බැවින් මෙම පටිපාටි සකස් කිරීම ප්‍රගතිය සොයාබැලීම සඳහා සමාලෝචන රැස්වීමක් යොදාගන්නා ලෙස දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 05 | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් හට පළාතෙන් බැහැර යාම සම්බන්ධයෙන් ලේකම්, කෘෂිකර්ම හා වාරිමාර්ග අමාත්‍යාංශ (බ.ප.) ලේකම් විසින් ඉදිරිපත් කරන ලද ලිපිය | පළාතෙන් බැහැර යාමේ අනුමැතිය තවදුරටත් ප්‍රධාන ලේකම් යටතේ පවත්වා ගැනීමට තීරණය විය.<br><br>පළාතෙන් පිටතට යෑම සම්බන්ධයෙන් නව අයදුම්පතක් මේ වන විට සකස් කර ඇති බවත්, පළාතෙන් බැහැර යාම සම්බන්ධ ඉල්ලීම එම අයදුම් පත්‍රයෙන් අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව ප්‍රධාන ලේකම් වෙත යොමු කරන ලෙසද දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, |
| 06 | "ජනපතිට කියන්න" ප්‍රගතිය සම්බන්ධව ප්‍රගති සමාලෝචනය 2017 අගෝස්තු මස ජනාධිපති කාර්යාලයේ පැවැත්වීමට නියමිත අතර එහි වර්තමාන තත්ත්වය සම්බන්ධව සාකච්ඡා කිරීම. | එක් එක් අමාත්‍යාංශවලින් පත්කර ඇති "ජනපතිට කියන්න" වැඩසටහනේ සම්බන්ධීකරණ නිලධාරීන් මගින් දැනට යොමු කර ඇති ගැටළුවලට අදාලව මෙතෙක් ක්‍රියා කර නොමැති ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමටත්, ඉටුකිරීමට හැකියාව නොමැතිනම් ඒ සම්බන්ධව අදාල පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 07. | ගබඩාවත්තේ ඉඩමෙහි නිල නිවාස ඉදිකිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවේ නිලධාරීන් සඳහා වර්ග 03 ක් යටතේ එනම් මාණ්ඩලික, මධ්‍යම මට්ටමේ නිලධාරීන්ට හා කණිෂ්ට කාර්ය මණ්ඩලය සඳහා නිලනිවාස ඉදිකිරීම සම්බන්ධයෙන් ලේකම්වරුන්ගේ අදහස් 2017.08.04 දිනට ප්‍රථම ලබා දෙන ලෙසත් අනතුරුව එම යෝජනා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර අනුමත වීමෙන් පසු එහි කටයුතු ආරම්භ කළ හැකි බවත් ප්‍රකාශ විය. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

| | | | |
|---|---|---|---|
| 08 | නව ගොඩනැගිල්ල අසල ඇති බස් නැවතුම්පළ ජයවඩනගම දක්වා දීර්ඝ කිරීම | බත්තරමුල්ල නව ගොඩනැගිල්ල අසල ඇති බස්නැවතුම්පළ ජයවඩනගම දක්වා ගෙන යාම සඳහා ප්‍රවාහන අධිකාරිය සමඟ සාකච්ඡා කිරීම | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 09. | 2017 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තු මුදල් සම්බන්ධව ඉදිරිපත් කරන ලද ගැටළුව | පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කිරිමේ දී පරිපූරක ඇස්තමේන්තු යන නාමයට ගැලපෙන ව්‍යාපෘති සඳහා පමණක් ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ලේකම් පෙන්වා දෙන ලදී.<br><br>2018 වර්ෂයේ ව්‍යාපෘති සඳහා දල ඇස්තමේන්තු අමාත්‍ය මණ්ඩල සාකච්ඡාවේ දී ඉදිරිපත් කළ පරිදි 2017 අගෝස්තු 31 වන දින වන විට ලබා දෙන ලෙසත්, එවිට අදාල ව්‍යාපෘති ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක කිරීමට හැකි බවත් ප්‍රධාන ලේකම් දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

……………………………………

**ප්‍රධාන ලේකම්,**
**බස්නාහිර පළාත.**